චක්‍රලේඛ අංක 05/2015

සමුපකාර සේවක කොමිෂන් සභාව,
උතුරු පළාත් සභාව,
35, අම්මන් වීදිය,
කන්දර්මඩම්,
යාපනය.
2015.05.28

උතුරු පළාතේ සියළුම සමුපකාර සමිති සහ සංගම්වල සභාපතිවරුන් වෙත.

**සමුපකාර සේවකයින් සඳහා ජීවන වියදම් ගෙවීම**

සමුපකාර සේවකයින්ට සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2012.03.14 දිනැති අංක 02/2012 දරණ චක්‍රලේඛය අනුව දැනට පවත්නා ජීවන වියම රු: 5850.00 ක මුදල ලෙවනු ලැබේ. මෙය පිළිබඳව සමාලෝචනය කල උතුරු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව ජීවන වියදම් වැඩි කිරීමක් සමුපකාර සේවකයින්ට ලබා දීමට තීරණය කර ඇත.

මෙම දීමනාව ගෙවීමට සමිතියට මුල්‍ය හැකියාව තිබිය යුතු අතර එය පිළිබඳව එම සමිතිවල අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමට පත් විය යුතුය. ග්‍රාමීය බැංකුවෙන් ලැබෙන අදායම් හැර සමිතිය තම ස්වඋත්සාහයෙන් ලාභ උපයන්නේ නම් පහත සඳහන් ආකාරයෙන් අදාල දීමනා අදාල දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස්ගේ අනුමැතිය මත ගෙවිය යුතුය.

මෙම චක්‍රලේඛය නිකුත් වන දිනය වන 2015.06.01 සිට රු: 7800/- ක් ජීවන වියදම් වශයෙන් ගෙවිය යුතුය. තාවකාලික හා අනියම් සේවකයින් හට දිනකට රු: 260/- ක දීමනාවක් මසකට රු:7800/- ක් වැඩි නොවන අයුරින් ගෙවිය යුතුය.

කලින් සමුපකාර සේවක කොමිෂන් සභාව නිකුත් කල චක්‍රලේඛ අනුව ලබා දන ලද විශේෂ දීමනා විධි විධාන එලෙසම ඉදිරියටද පවත්වේ.

සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා එය සහභාගිත්වය සහ විශ්‍රාම පාරිතෝෂිකය ගණනය කිරීමේදී මෙම දීමනාව ඇතුලත් කල යුතුය.

කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන සේවකයින්ටද මෙම දීමනාව හිමි නොවිය යුතුය.

මෙම ජීවන දීමනාව වැඩි වීම ගෙවීම සම්බන්ධව සමිතියේ කාරක සභාව විසින් ගනු ලබන තීරණය සම්බන්ධයෙන් 2015.08.01 දිනට පෙර අදාල දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස් මගින් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත දැනුවත් කල යුතුය.

මෙම චක්‍රලේඛය උතුරු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ එකගත්වය මත පළාත් සමුපකාර සංවර්ධන අමාත්‍ය පි. අයින්ගරනේෂන් මහතාගේ අනුමැතිය සමග ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අත්සන

පී. වාකීසන්, P.VAGESHAN
Secretary
ලේකම්. Co-operative Employees Commission
Northern Provincial Council